මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*

කාර්යාලය / காரியாலயம் / Office – 081-2213097
ලේකම් / செயலாளர் / Secretary – 081-2213096
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary – 081-2213097
ෆැක්ස් / பெக்ஸ் / Fax – 081-2213082

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/6/20(V3)
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2026.03.04

සියලුම විභාග අපේක්ෂකයින් වෙත,

**<u>මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණිය / එක් වසරක පුහුණු ශ්‍රේණිය / දෙවසරක පුහුණු ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2025</u>**

උක්ත බඳවා ගැනීමේ තරග විභාගය 2026.03.14 වන දින පැවැත්වීමට නියමිත අතර, මෙම විභාගය සඳහා අයදුම්කළ හා නියමිත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරන ලද ජංගම දුරකථන අංක වෙත කෙටි පණිවිඩ (sms) මඟින් යොමු කර ඇති බව කාරුණිකව දන්වමි.

02. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍රයෙහි දෘඪ පිටපතක් නිකුත් නොකරන අතර, 2026.02.27 දින මෙම කාර්යාලය මඟින් ඔබ වෙත යොමු කර ඇති කෙටි පණිවිඩයේ සඳහන් දිගුවට (link) ගොස් ප්‍රවේශපත්‍රය බාගත කරගත යුතු ය. ඉන් අනතුරුව ප්‍රවේශපත්‍රය A4 කඩදාසියක <u>**දෙපස මුද්‍රණය කර ගතයුතුය**</u>.

03. යම් හෙයකින් උක්ත විභාගය සඳහා අයදුම්කළ නමුත් ප්‍රවේශපත්‍රය නොලැබුණේනම් හෝ තමන් වෙත ලද ප්‍රවේශපත්‍රයේ යම් ගැටළුවක් ඇත්නම් 2026.03.04 දින සිට 2026.03.11 දින දක්වා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් (081-2213097) විමසිය යුතුය. 2026.03.11 දිනෙන් පසුව උක්ත විභාගය සම්බන්ධයෙන් සිදුකරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

04. 2026.03.14 වන දින පෙ.ව 9.00 සිට ප.ව 1.30 දක්වා මහනුවර විද්‍යාර්ථ විද්‍යාලයේදී උක්ත විභාගය පැවැත්වෙන අතර, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සියලුම කොන්දේසිවලට යටත්ව සියලු අයදුම්කරුවන් විභාගය සඳහා පෙනී සිටිය යුතු බව වැඩිදුරටත් සඳහන් කරමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී.විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.